## දේශන කුසලතා තරගය

මෙම තරගය අංශ හතර ම සඳහා පැවැත්වේ. පාරම්පරික දේශන සම්ප්‍රදායයන්ට අයත් විවිධ දේශනාවන් පිළිබඳ විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබද දේශනාවක් පෞරාණික දේශන විලාසයට අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.7. අභිමතාර්ථ

1.7.1. ලාංකික භික්ෂූන් වහන්සේලා පරපුරින් පරපුරට පවත්වාගෙන ආ දේශනා සම්ප්‍රදායයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උනන්දු කරවීම

1.7.2. සම්ප්‍රදාය ආරක්ෂා කරමින් ශාසන ගෞරවය සුරක්ෂිත වන පරිදි දේශනා ක්‍රම ඉදිරිපත් කිරීමට පෙළඹවීම.

1.8. තරග කොන්දේසි

1. ඒ අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන දේශනාවක් හෝ කිහිපයක් කර පෙන්විය යුතු ය.
2. එක් තරගකරුවෙකුට විනාඩි 07ක කාලයක් හිමි වේ.
3. සාම්ප්‍රදායානුකූල දේශනා විලාසයන් නොබිඳ ඉදිරිපත් කිරීම කළ යුතු ය.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
5. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ දේශනාවක් ඉදිරිපත් කළ යුතු ය.

I. නමස්කාර ගාථා
II. ජාතක දේශනා
III. දේවතාරාධනා
IV. විහාර අස්න
V. දොරකඩ අස්න අනුශාසනාව
VI. පරිත්‍රාණ දේශනාවේ විවිධ ක්‍රම (පිරිත් පිරීම, පොත පිරීම, බොජ්ඣංග ගාථා, සූත්‍ර දේශනා, ආටානාටිය සූත්‍රය හා ඒ ඒ අවස්ථාවලට අදාළ නමස්කාර ක්‍රම)

1.9. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| I. | සාම්ප්‍රදායානුකූල බව | 10 |
| II. | නිවැරදි අක්ෂර හා වචන උච්චාරණය | 10 |
| III. | ශ්‍රවණ මාධුර්යය | 10 |
| IV. | හඬ පාලනය | 10 |
| V. | ශාසන ගෞරවයෙන් ඉදිරිපත් කිරීම | 10 |
| | මුළු ලකුණු | 50 |